දෙවන වාර පරීක්ෂණය* 2018

මතුගම අධ්‍යාපන කලාපය

නාට්‍ය හා රංග කලාව | 6 | කාලය පැය 02 යි

නම ------------------------------------- පන්තිය ------

සැලකිය යුතුයි

- ❖ ප්‍රශ්න පත්‍රය i කොටස හා ii කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තයි .
- ❖ i කොටසේ ප්‍රශ්න සියල්ලටම හා ii කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සැපයිය යුතුයි.

---

1-5 දක්වා ප්‍රශ්න වල ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශය නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියේ දී තිබෙන වරහන තුළ යොදන්න

(1) කතාන්දරයක් හා නාට්‍යයක් අතර වෙනස් කම් තිබේ (...........)

(2) නාට්‍යයක් ශ්‍රාවකයා අරමුණු කරගෙන නිර්මාණය කරන ලද්දකි (...........)

(3) කතාන්දරයක් රඟපා පෙන්විය හැක (...........)

(4) නාට්‍යයක් බලා රසවිඳිය නොහැක (...........)

(5) නාට්‍යය යනු යමක් කර පෙන්වීමයි (...........)

පහත අ කොටස ආ කොටස සමග නිවැරදිව ගලපන්න

| | අ | | ආ |
|---|---|---|---|
| (6) | පාට පාට වළාකුළු | - | ජනකතා |
| (7) | මීදුම | - | වෛද්‍ය නලාව |
| (8) | වෛද්‍යවරයා | - | උදෑසන |
| (9) | නාඩි වැටීම | - | අනුකරණය |
| (10) | රංග උපකරණ | - | ඉර බැස ගෙන යාම |

පහත සඳහන් ප්‍රශ්න වල හිස්තැනට වරහන තුළ දී ඇති වචන අතරින් නිවැරදි වචනය තෝරා වාක්‍ය අර්ථවත්ව සම්පූර්ණ කරන්න

( සතර අභිනය, භූමිකා, සමාරෝපය, සාත්වික අභිනය, ජනකතා )

(11) යහපත් ජීවිතයකට ආදර්ශ .................................... වලින් සපයා ගත හැක

(12) විවිධ .................................... අනුව පුද්ගලයාගේ බාහිර පෙනුම වෙනස් විය යුතුය

(13) භාව නිරූපණය සඳහා .................................... අවශ්‍යමය

(14) සාර්ථක චරිත නිරූපණයක් සඳහා .................................... යොදා ගත යුතුය

(15) .................................... අනුව රූපණයේ සාර්ථක භාවය රඳා පවතී

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න

(16) හඬ පාලනය පුහුණු කිරීම සඳහා උදව්කර ගත හැක්කේ කුමන අභ්‍යාසද?
(1) ස්වසන අභ්‍යාස (2) ශිථිලකරණ අභ්‍යාස
(3) තාපන අභ්‍යාස (4) සංවේදන අභ්‍යාස

(17) පන්ති කාමරයේදී ක්‍රියාකාරකමක් ලෙස ඔබව රවුමට සිටවා අභිනය භාවිතයෙන් අයිස් කැබලි කීපයක් අතින් අත හුවමාරු කරන ආකාරයේ ක්‍රියා කාර කමක් සිදුකරනු ලැදැයි සිතන්න. මේ ක්‍රියාකාරකම තුළින් අවබෝධ කරවන්නේ
(1) මනස හා සිරුර අතර සබඳතාව හඳුනා ගැනීමයි
(2) සංවේදන කාරකයන් ආශ්‍රිත හැඟීම්ය
(3) සංවේදන කාරකයන් ආශ්‍රිතව ශාරීරික චලනයන් හඳුනා ගැනීමයි
(4) ස්පර්ශය ඇසුරෙන් ලබන මානසික සංවේදන විවිධ චලන වලට හේතු වන බව දැනගැනීමයි

(18) ක්ෂණික නිරූපණයක් යනු
(1) සූදානමකින් තොරව ඉදිරිපත් කරන නිරූපණයකි
(2) ඉතා කෙටි කාලයක් තුළ සූදානම්ව ඉදිරිපත් කරන නිරූපණයකි
(3) සාමූහිකව සූදානම්ව ඉදිරිපත් කරන නිරූපණයකි
(4) තනිව ඉදිරිපත් කරන නිර්මාණයකි

(19) රූපණය සම්බන්ධව අද්දැකීම් ලබාගැනීමට සුදුසුම මාර්ගය වන්නේ
(1) සජීවී වේදිකා නාට්‍ය නැරඹීමයි
(2) වේදිකා නාට්‍ය පොත්පත් බැලීමයි
(3) රංග අභ්‍යාස වල නිරත වීමයි
(4) කණ්ඩායම් ක්‍රියාකාරකම් වල නිරත වීමයි

(20) පොල් කටු දෙකක් යොදා ගෙන නිර්මාණය කළ හැකි හඬකි
(1) අශ්වයෙකු නගන හඬ
(2) ගෙරවිලි හඬ
(3) අශ්ව කුර ගැටෙන හඬ
(4) ගමන් කරන දුම්රියක හඬ

(20×1 = 20)

## ii කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2 කට  පිළිතුරු සපයන්න.

1 ඇටිකිති චූස්
කකුළු චරස් හාවා කළ එකෙල විකල
මේ මරණීන් බේරුණොතින්
තවත් නොකම් .................

(1) මෙම කොටස ඇතුළත් වන්නේ කුමන කතාවකද? ( ලකුණු 02 )

(2) තවත් නොකම් යනුවෙන් පවසන්නේ මොනා ගැනද? ( ලකුණු 02 )

(3) මෙම සංවාද කොටස කියන්නේ කවුද? ( ලකුණු 02 )

(4) මෙම සංවාද කොටස කියන්නේ කුමක් සඳහාද? ( ලකුණු 02 )

(5) මෙම සංවාද කොටස පැවසීමෙන් පසු සිදුවන්නේ කුමක්ද? ( ලකුණු 02 )

2 සෙල්ලම් සිතින් වත්
යම්කිසි තරහකින් වත්
මරණ සිතකින් වත්

..................................................

(1) මෙම කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න ( ලකුණු 02)

(2) මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න ( ලකුණු 03)

(3) මෙම කවියේ අදහසට ගැලපෙන ලෙස චරිත 4ක් යොදා ගෙන
කෙටි නාට්‍යමය අවස්ථාවක් ලියන්න ( ලකුණු 05 )

3 (1) ජන ක්‍රීඩාවන් දෙකක් නම් කරන්න ( ලකුණු 02 )

(2) ඔබ ලියන ලද එක් ජන ක්‍රීඩාවකට අදාළ කවියක් ලියන්න ( ලකුණු 03 )

(3) ජන ක්‍රීඩා තුළින් වර්ධනය කරගත හැකි ගුණාංග දෙකක් දක්වා
ඉන් එකක් විස්තර කරන්න ( ලකුණු 05 )

4 (1) ජන කතා යන්න හැඳින්වීම සඳහා නිර්වචනයක් ලියන්න ( ලකුණු 02 )

(2) විවිධ ක්ෂේත්‍ර ඔස්සේ නිර්මාණය වූ ජනකතා වර්ග තුනක් ලියන්න ( ලකුණු 03 )

(3) විවිධ ජනකතා එකතු කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වා විස්තරකරන්න ( ලකුණු 05 )

5 වේෂ භූෂණය සඳහා අවශ්‍ය රංගා භරණයක් නිර්මාණය කර ගැනීම පහත සඳහන් ශීර්ෂ යටතේ විස්තර කරන්න

(1) රංගාභරණයේ නම ( ලකුණු 02 )

(2) අවශ්‍ය අමු ද්‍රව්‍ය ( ලකුණු 03 )

(3) සාදන ආකාරය , වර්ණ ගැන්වීම හා නිමාව
( ලකුණු 05 )

(3x10= 30)